ස්වදේශ කටයුතු චක්‍රලේඛ : 11/2020

මගේ අංකය -HA/1/7/4/7
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,
නිල මැදුර,
ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට,
කොළඹ 05.
2020.03.17

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිසාපතිවරුන්,
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

**වාහන ආදායම් බලපත්‍ර ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් නිකුත් කිරීම තාවකාලිකව අත්හිටුවීම**

කොරෝනා (COVID -19) වෛරසයේ ව්‍යාප්තිය හැකි තරම් අවම කළ හැකි පරිදි මහජනතාව කණ්ඩායම් ලෙස එක්රැස්වීම වැළැක්වීම සඳහා සියලු අවස්ථාවෝචිත ක්‍රියාමාර්ග ගැනීම රජයේ ආයතන සියල්ලෙහිම මූලික වගකීම බැවින් අද (2020.03.17) දින සිට 2020 මාර්තු 31 දින දක්වා වාහන ආදායම් බලපත්‍ර ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් නිකුත් කිරීමේ කටයුතු තාවකාලිකව අත්හිටුවන ලෙස මෙයින් දැනුම් දෙමි.

02. මේ අනුව 2020.03.31 දක්වා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ඇතුළුව සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි වාහන ආදායම් බලපත්‍ර නිකුත් කිරීම හෝ ඒ ආශ්‍රිත සේවා ක්‍රියාත්මක නොකරන ලෙස දැනුම් දෙමි. එසේ වුවත් අන්තර්ජාලය මඟින් ආදායම් බලපත්‍ර ලබාගැනීමේ සේවාව පුළුල් කර ඇති නිසා, එමඟින් ආදායම් බලපත්‍රය ලබාගැනීමේ හැකියාව පවතී.

03. තවද ආදායම් බලපත්‍ර නිකුත් කිරීම ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් තාවකාලිකව අත්හිටුවා ඇති කාලය සඳහා හිඟ මුදල් සහ දඩ අයකිරීම සිදුනොකරන අතර, සිදුවිය හැකි අපහසුතාවන් අවම කරගැනීම සඳහා මාර්ගගත සේවාව (Online) භාවිත කරන ලෙස බලපත්‍ර හිමියන් දැනුවත් කරන ලෙසද දැනුම් දෙමි.

04. 2020 මාර්තු මස 31 වැනි දින දක්වා කාලයට අදාළ වන ආදායම් බලපත්‍ර ලබාගැනීම ප්‍රමාද විය හැකි පුද්ගලයින් හට මහා මාර්ග පරීක්ෂාවේදී සහනයක් ලබාදෙන ලෙස ශ්‍රී ලංකා පොලීසිය දැනුවත් කරනු ඇත.

එස්.හෙට්ටිආරච්චි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය